| Class | 371.1412 |
| --- | --- |
| No | H15 |

# පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයට සිසුන් සූදානම් කිරීම අරමුණු කරගෙන ඉගැන්වීමේ දී ගුරුවරු මුහුණදෙන ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

OUSL Library.
Donated by.
Dr. W. M. S.
Wanasinghe

A. N. W. හැත්නදි

OPEN UNIVERSITY
74471

OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

# සංක්ෂිප්තය


ප්‍රාථමික අධ්‍යාපනය ශිෂ්‍ය ජීවිතයේ වැදගත්ම අවධියකි. එහිදී ප්‍රාථමික අධ්‍යාපනයේ අවසන් කඩඉම වන්නේ තෙවන ප්‍රධාන අවධියයි. මෙය ප්‍රාථමික අධ්‍යාපනයේ පසුවන ශිෂ්‍යයින්ට තිරණාත්මක කඩඉමකි. ඒ ශිෂ්‍යත්ව විභාගය පැවැත්වෙන්නේ පහ ශ්‍රේණියේ බැවිනි. පර්යේෂිකාව වසර ගණනාවක් පහ ශ්‍රේණියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතවී සිටීම නිසාත් පහ ශ්‍රේණියේ සිසුන් ශිෂ්‍යත්ව විභාගයට සූදානම් කිරීම අරමුණු කර ඉගැන්වීමේදි ගුරුවරු මුහුණදෙන ගැටලු පිළිබඳ අධ්‍යයනයක් ලෙස මෙම අධ්‍යයනය සිදුකිරීමට තෝරා ගැනුණි.

අධ්‍යයනයට අදාළව න්‍යායාත්මක හා ආනුභාවික සාහිත්‍ය විමර්ශනය සිදුකෙරිණි. මෙහිදි, ශිෂ්‍යත්ව විභාගයට මුහුණදෙන වසයේ ළමයින්ගේ ස්වභාවය, සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධියේ පසුවන ශිෂ්‍යයින්ට ඉගෙනුම් අවස්ථා සම්පාදනය තෙවන ප්‍රධාන අවධියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ස්වභාවය පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයේ ස්වභාවය පිළිබඳවත් සොයා බලන ලදි. ආනුභාවික විමර්ශනය මගින් දේශිය හා විදේශිය පර්යේෂණ සාහිත්‍ය පරිශිලනයක් සිදුවිය.

මෙම අධ්‍යයනය සඳහා යොදා ගැනුනේ සමීක්ෂණ පිරිසැලැස්මයි. ඒ අනුව පර්යේෂණ ප්‍රශ්න හතරක් ඔස්සේ මෙම ගැටලුව පිළිබඳ අධ්‍යයනය සිදුවිය. එහිදි සුවිශේෂි අරමුණු ලෙස පහ ශ්‍රේණියේ සිසුන් ශිෂ්‍යත්ව පරීක්ෂණයට සූදානම් කිරීම අරමුණු කරගෙන ඉගැන්වීමේදි ගුරුවරුන් දැනට අනුගමනය කරන ක්‍රියා මාර්ග සොයා බැලීම, පහ ශ්‍රේණියේ සිසුන් ශිෂ්‍යත්ව පරීක්ෂණයට සූදානම් කිරීම අරමුණු කරගෙන ඉගැන්වීමේදි ගුරුවරුන් මුහුණදෙන පාසල ආශ්‍රිත ගැටලු හඳුනාගැනිම, පහ ශ්‍රේණියේ සිසුන් ශිෂ්‍යත්ව පරීක්ෂණයට සූදානම් කිරීම අරමුණු කරගෙන ඉගැන්වීමේදි ගුරුවරුන් මුහුණදෙන ·සිසුන් ආශ්‍රිත ගැටලු හඳුනාගැනිම, පහ ශ්‍රේණියේ සිසුන් ශිෂ්‍යත්ව පරීක්ෂණයට සූදානම් කිරීම අරමුණු කරගෙන ඉගැන්වීමේදි ගුරුවරු මුහුණදෙන ගැටලු සඳහා විසඳුම් යෝජනා කිරීම යොදා ගැණිනි.

මෙහිදී තංගල්ල අධ්‍යාපන කලාපයේ පාසල් නියදිය සඳහා තෝරා ගන්නා ලදි.ඒ අතුරින් පාසල් 30ක ගුරුභවතුන් හා ගුරු උපදේශකවරු පස්දෙනෙකු නියදියට ඇතුළත් කරගන්නා ලදි. නියදියට අදාළව දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලිය හා සම්මුඛ සාකච්ජා ෂෙඩ්‍යුල යොදාගන්නා ලදි. රැස්කරගත් දත්ත වගු, ප්‍රස්තාර හා ප්‍රතිශත ලෙස ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමභ මගින් මෙන්ම සාරාංශගත, විස්තරාත්මක, ව්‍යුහාත්මක සන්ධාර විශ්ලේෂණය යන

විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම මගින් ද විශ්ලේෂණය කරන ලදි. දත්ත අර්ථකථනය අරමුණු මූලිකව සිදුකරන ලදි.

එහිදී පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට සිසුන් සූදානම් කිරීම අරමුණු කරගෙන ඉගැන්වීමේදී ගුරුවරු දැනට අනුගමනය කරන ක්‍රියාමාර්ග යටතේ සිසුන්ට අමතර පන්ති පැවැත්වීම, ශිෂ්‍යත්ව විභාගය ඉලක්ක කර සම්පූර්ණ විෂය නිර්දේශයම ආවරණය කිරීම හා ඉලක්ක ප්‍රශ්නපත්‍ර සඳහා සිසුන් හුරුකිරීම සිදුකරන බවත් අනාවරණය විය. එසේම ශිෂ්‍යත්ව විභාගයට පෙර විෂය සමගාමී ක්‍රියා සැලසුම් කිරීම, දුර්වල සිසුන් කෙරේ අවධානය ලබාදීම හා ශාරීරික සුවතා ක්‍රියාකාරකම් සිදුකිරීම නිසි අයුරින් සිදුනොවන බවත් අනාවරණය විය.

පහ ශ්‍රේණියේ සිසුන් ශිෂ්‍යත්ව විභාගයට සූදානම් කිරීම අරමුණු කරගෙන ඉගැන්වීමේදී නිවසින් ලැබෙන සහය ප්‍රමාණවත් නොවන බවත්, ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් මගහරින බවත්, ගුරුවරුන්ට අමතර පන්ති පැවැත්වීමට සිදුවීම සිසුන්ගේ මෙන්ම ගුරුවරයාට මානසික නිදහස නැතිවීම යන ගැටලු පවතින බව ද අනාවරණය විය. එම අනාවරණයන්ට අදාළව නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීමේදී ඉදිරි පර්යේෂණ ක්‍රම, යෝජනා ඉදිරිපත් කිරීමත් මෙම අධ්‍යයනයෙන් සිදුකරන ලදි.

# Abstract

Primary Education is a significant stage in a student~s life. There" the third key stage is the final stage of Primary Education. This is a crucial milestone for a primary student" because the Scholarship examination held in grade five' As the researcher has been in the process of teaching grade five students for many years, the study was chosen to be a study of the problems faced by teachers due to teaching with the aim of preparing grade five students for scholarship examination.

Theoretical and empirical literature review was done related to the research. The research was conducted on the nature ofgrade five students, proving lerning oppurtunities for students in period of concrete operations stage, the features of the third key stage and the nature of the grade five scholarship examination, Local and forign research were reviewed under empirical literature review.

The method of Survey Research design was used in this research' Accordingly, four research questions were studied, what the teacherscurrently practise to prepare their students for grade five scholarship examination, which school grade five students for scholarship examination, and which solutions are suggested for teachers~ problems when preparing students for grade five scholarshipexamination.

The sample selected, was the schools in Tangalle Edncational Zone. Teachers from thirty schools and five ISAS (In service Advisors) were selected, questionnaire and Interview schedule were used as data collection methods The collected data were quantitalively presented in gruphs, charts, and in

percentages, and qualitatively presented in summarization, description, and structural analysis.

It was discovered that teachers conduct extra classes, cover the whole syllabus before the grede five scholarship examination, and practise students to answer target queshion prepares , before the grede five examination ' however, it was also revealed that, they neglect planning co-curriculer activities, paying attention to weaker students' and conducting physical fitness activities before the scholarship examination'

It was further discovered that the assistance received by students from home is not sufficient and the teachers ignore the activity Based Teaching Learning process. Further, it was revealed that, conducting extra classes reduce the mental freedom and relaxation of students and teachers. The future research methods, solutions, and suggestions were also presented.